**වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය**

-----------------------------------------

1. **මූල්‍ය ප්‍රකාශන**

---------------

1.1 **මතය**

--------

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත් , මෙම වාර්තාවේ 1.2 ජේදයේ දක්වා ඇති කරුණු වලින් මූල්‍ය ප්‍රකාශන වලට වන බලපෑම හැර 2010 දෙසැම්බර් 31 දිනට වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතු වල මූල්‍ය ප්‍රතිඵල හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නාවූ මතය වේ.

1.2 **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

-------------------------------------------

1.2.1 **මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

--------------------------------

විගණනයේ දී අනාවරණය වූ ගිණුම්කරණ අඩුපාඩු සහ මූල්‍ය ප්‍රකාශවල ඇතුළත් විෂයයන් උපලේඛණ හා ශේෂ පිරික්සුම සමඟ නොසැසඳුන අවස්ථා ආයතනය වෙත දන්වා යවන ලද අතර අදාල පැහැදිලි කිරීම් සහ නිවැරදි කිරීම් විගණනය වෙත ලබාදෙන ලදී.

1.2.2 **ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

-----------------------------------

(අ) ස්ථාන මාරුවීම හා සේවයෙන් ඉවත් වීම නිසා දැනට සේවයේ නොයෙදෙන කාර්ය මණ්ඩලයේ නිලධාරීන් හය දෙනෙකුගෙන් අය විය යුතු එකතුව රු:13,224 ක ණය ශේෂයක් වසර තුනක කාලයක් තිස්සේ අය නොවී පැවතුණි.

(ආ) ලැබිය යුතු ගිණුම්වල ඇතුළත් විවිධ අත්තිකාරම් රු:209,761 ක් හා ලැබිය යුතු ආයෝජන පොලී ආදායම් රු: 43,479 ක් වසර තුනකට වැඩි කාලයක් තිස්සේ අය කර ගෙන නොතිබුණි.

(ඇ) ගෙවිය යුතු ගිණුම් වල ඇතුළත් වසර තුන ඉක්ම වූ විවිධ සැපයුම් කරුවන්ගෙන් රදවාගත් මුදල් වල වටිනාකම රු:54,867 ක් විය.

### 1.2.3 විගණනය සඳහා සාක්ෂි නොවීම.

-----------------------------------

එකතුව රු: 285,738,457 ක් පිරිවැය වූ ස්ථාවර වත්කම් සම්බන්ධයෙන් යාවත්කාලීන කරන ලද ස්ථාවර වත්කම් ලේඛනය හා භාණ්ඩ සමීක්ෂණ වාර්තා විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

### 1.2.4 නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම

----------------------------------------------------------------------

පහත සඳහන් අනුකූල නොවීමේ අවස්ථා නිරීක්ෂණය විය.

| නීති,රීති රෙගුලාසි ආදියට යොමුව<br>---------------------------- | විස්තරය<br>------------- |
|---|---|
| (අ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ උසස් අධ්‍යාපන ආයතන සඳහා වන ආයතන සංග්‍රහයේ V පරිච්ඡේදයේ 5.2 ඡේදය | අනධ්‍යයන කාර්යමණ්ඩලයේ නිලධාරීන්ගේ සේවා කාලය වයස අවුරුදු 60 කට සීමා කර තිබියදී එම වයස් සීමාවන් නොසලකා වයස අවුරුදු 61 ක් වූ නිලධාරීන් දෙදෙනෙකු අමාත්‍ය මණ්ඩල අනුමැතියකින් තොරව තවදුරටත් සේවයේ යොදවා තිබුණි. මේ සම්බන්ධයෙන් වෙනත් විකල්පයක් නොමැති බව අධ්‍යක්ෂකවරයා දැනුම් දී ඇත. |
| (ආ) 2009 ජුනි 19 දිනැති අංක PGIM/MERC/DFM - OL/2009 ලිපිය | දුරස්ථ අධ්‍යාපන නවීකරණ වැඩසටහන යටතේ පවුල් සෞඛ්‍ය ඩිප්ලෝමා පාඨමාලාව සඳහා ලැබූ ආයතන අරමුදල් වලින් වියදම් දැරීම පිළිබඳව ආයතන අධ්‍යක්ෂවරයා විසින් නිකුත් කර තිබූ උපදෙස් වලට අනුව ව්‍යාපෘති අරමුදල් වලින් දේශක ගාස්තු නොදැරිය යුතුය. එහෙත් ආයතන අරමුදල් වලින් ව්‍යාපෘති සම්බන්ධීකාරක දීමනා නොදැරිය යුතුය. එහෙත් එකී නියමයන්ට පටහැනිව ව්‍යාපෘති අරමුදල් වලින් උපදේශන ගාස්තු ලෙස රු:403,000ක් සහ ආයතන අරමුදල් වලින් සම්බන්ධීකාරක දීමනා ලෙස රු: 392,000 ක් ගෙවා තිබුණි. |

## 2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

------------------------------------

### 2.1 මූල්‍ය සමාලෝචනය

--------------------

#### 2.1.1 මූල්‍ය ප්‍රතිඵල

--------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආයතනයේ වැඩ කටයුතුවල ප්‍රතිඵලය, පුනරාවර්තන වියදම් සඳහා රජයේ ප්‍රදානය ගණන් ගැනීමට පෙර රු.45,558,680 ක ඌනතාවයක් වූ අතර, ඉකුත් වර්ෂයේ අනුරූපී ඌනතාවය රු.48,145,401 ක් විය. පුනරාවර්තන වියදම් සඳහා රු.72,909,000 ක් වූ රජයේ ප්‍රදානය ගණන් ගැනීමෙන් පසු සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු.27,350,320 ක අතිරික්තයක් බවට පත්ව තිබූ අතර ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම් සඳහා රු.74,800,000 ක් වූ රජයේ ප්‍රදානය හේතුවෙන් එම වර්ෂයේ ඌණතාවය රු.26,654,599 ක අතිරික්තයක් බවට පත් වී තිබුණි.

### 2.2 මෙහෙයුම් සමාලෝචනය

----------------------------

#### 2.2.1 කාර්ය සාධනය

-----------------

සමාලෝචිත වර්ෂයේ ආයතනය විසින් විවිධ පශ්චාත් උපාධි පාඨමාලා යටතේ වෛද්‍යවරුන් 3,209 ක් සඳහා විභාග පවත්වා තිබූ අතර සමත් වූ ප්‍රමාණය 1,053 ක් විය.

#### 2.2.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

---------------------------------

(අ) විශ්වවිද්‍යාල ආයතන සංග්‍රහයේ XXVI පරිච්ඡේදයේ 2.1 ප්‍රකාරව උසස් අධ්‍යාපන ආයතනවලට අයත් සියළුම වත්කම් වාර්ෂිකව සමීක්ෂණය කර මුදල් රෙගුලාසි 756 ප්‍රකාරව අදාල සමීක්ෂණ මණ්ඩල වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) 2007-2010 වර්ෂයන් තුළ මිලදී ගත් රු: 13,282,413ක් වටිනා වත්කම්, ස්ථාවර වත්කම් ලේඛණයට ඇතුළත් කර නොතිබුණු අතර එම කාලය තුළ මිලට ගෙන තිබූ මුළු වටිනාකම රු:18,709,581ක් වූ වත්කම් ප්‍රධාන ඉන්වෙන්ට්‍රි ලේඛණයට ද ඇතුළත් කර නොතිබුණි. ඉහත ලේඛණ යාවත්කාලීනව නොපැවැත්වීම නිසා විශ්වවිද්‍යාල ආයතන සංග්‍රහයේ XXVI පරිච්ඡේදයේ 2.7 සහ 2.8 ඡේදය අනුව වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයන් පැවැත්වීමට නොහැකිව තිබුණි.

(ඇ) විශ්වවිද්‍යාල ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයේ 3.9 ඡේදයේ සඳහන් පරිදි ආචාර්යවරයෙකුට/නිලධාරියෙකුට පෞද්ගලික හෝ රාජකාරි අවශ්‍යතා සඳහා නිකුත් කර ඇති භාණ්ඩ ඔහුගේ පෞද්ගලික භාරයේ තිබිය යුතු අතර එම භාණ්ඩ බාරගත් බවට සනාථ කිරීම් සහිතව ඒ බව අදාල ඉන්වෙන්ට්‍රියෙහි ද සටහන් කළ යුතුය. එසේ වුවත් ආයතනය විසින් ආචාර්යවරුන් හා නිලධාරීන් වෙත නිකුත් කර තිබූ වටිනාකම රු: 11,624,075 ක් වූ වත්කම් නිකුත් කිරීමේ දී එකී නියමයන් අනුව කටයුතු කර නොතිබුණි.

### 2.2.3 අයවැය පාලනය

------------------

ප්‍රාග්ධන වියදම් සම්බන්ධයෙන් අයවැය ගත අගයන් සහ සත්‍ය වියදම අතර ප්‍රමාණාත්මක විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛණය ඵලදායී කළමනාකාරිත්ව පාලන කාරකයක් වශයෙන් යොදාගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

## 3. පද්ධති හා පාලන

-------------------

විගණනයේ දී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු ආයතනයේ අධ්‍යක්ෂවරයා වෙත වරින් වර දන්වන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුය.

(අ) වත්කම් කළමනාකරණය

(ආ) ආදායම් ගිණුම්කරණය